www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 18 - මිහිලිය නළලේ අංජන තිලකේ...

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත පද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

මහවැලි කළු කැලණි වලවේ අත් හතරක් ඇති ලංකා
සමනොළ කිරිගල් පිදුරුතලා ඇ කෙහෙ ගැට බැඳි ලංකා
තේ වතු පොල් වතු කෙත් වතු පෙළ උකුළේ නළවන ලංකා
මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා

ඔබහට අත පොවනට උන්-මුන්හට ඉඩ නො තබමු ලංකා
අව හොත් මෙහි උන් ලුහුබඳවා ගොළු මුහුද හොවමු ලංකා
ගොඩ දිය අහසේ හැම තැනැ ඔබගේ නම කියවමු ලංකා
ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති සේ සලකමු ලංකා

I. කවියා ලංකා මාතාවගේ බඳින ලද කේශ කලාප ලෙස දකින්නේ මොනවා ද?
II. මෙහි සඳහන් රූපක දෙකක් ලියා දක්වන්න.
III. ශබ්ද රසය මතු කිරිමට කවියා යොදන ලද උපක්‍රම තුනක් ලියන්න.
IV. පද්‍යයෙහි සඳහන් අසම්භාව්‍ය ක්‍රියා පද දෙකක් ලියන්න.
V. ඉහත සඳහන් කොටස ඇතුළත් පද්‍ය නිර්මාණය කළේ කවුරුන් විසින් ද?

*සැකසුම: ප්‍රියංගනී මිය*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk